ලංකාවිත්ති
LANKA VITHTHI

LANKA VITHTHI
P. O. BOX 6 4 6 7 8
LONDON NW3 9LS
E N G L A N D


*Phone* : 0 2 0 7 4 2 8 9 3 8 8
*Fax* : 0 8 7 1 9 0 0 5 1 6 3
*E-mail* : lanka.viththi @ virgin.net

කර්තෘ : දයා ආනන්ද රණසිංහ
*Editor* : Daya Ananda Ranasinghe

චිත්‍ර : චන්දන සෙනෙවිරත්න
*Art* : Chandana Seneviratna

පරිගණක කටයුතු : චන්න කබ්රාල්
*Computer Graphics* : Channa Cabraal

ඡායාරූප : ආනන්ද කාරියවසම්
*Photography* : Ananda Kariyawasam

# කොටි උවදුර ඉවර නැත!

ගිය සතියේ කොළඹ වරාය අසල ඔත්තු බල මින් සිටි කොටි හමුදාවේ පැරණි බුද්ධි අංශ යට අයත් කොටියෙකු පිටකොටුව පොලිසිය විසින් අත්අඩංගුවට ගන්නා ලද බවක් ප්‍රවෘත්ති වල පළවී තිබෙනු දුටුවෙමි. එය යුද්ධය අවසන් වූ බව ඇසූ පසු ඇතිවූ ප්‍රීතිය සහ සහනය සමග එදා ද මට ඇතිවූ සැකයක සේයා මාත්‍රය යළි පණගසා ඒමකි.

ගිය වසරේ මැයි මස යුද්ධය ස්ථිර වශයෙන්ම නිමාවකට පත්වූ අවස්ථාවේ යළිත් කිසි දිනක කොටියන්ට හිස එසවිය නොහැකි බවට සහතිකයක් ද අප කා අතරත් ඉබේම තහවුරුව ගියේය. කොටි නායකයාත්, ඔහුගේ පවුලේ සියළු දෙනාත්, සංවිධානයේ ජ්‍යෙෂ්ඨයන් රැළත් ඝාතනය වූ බව පැහැදිලි විය. එසේම කොටියන්ගේ ආයුධ සියල්ලම පාහේ අසුවීමෙන් ද, උන්ගේ නැව් බෝට්ටු හා අහස් යානා ආදී සියල්ල විනාස කිරීම ද ශ්‍රීලංකා සන්නද්ධ හමුදා අතින් සිදුවූ අයුරුද විස්තර ඇතිව මාධ්‍යයේ පළ වූ පසු ශ්‍රී ලංකාවේ බොහෝදෙනා තුළ ඇතිවුණේ වචනයෙන් කිව නොහැකි සහනයකි. කොටි හමුදාවේ සාමාජිකයෝ සියල්ලන්ම පාහේ හමුදාවන්ට බාරවූහ. ඔවුන් පුනරුත්ථාපන කිරීමේ කටුයුතු ශ්‍රීලංකා රජය විශාල වියදමක් සහ වගකීමකින් යුතුව කරගෙන යන බවද පැහැදිලිව පෙනේ. මෑත අතීතයේ තහනම් ප්‍රදේශ බවට පත්ව තිබුණු උතුර සහ නැගණහිර පළාත් දැන් මුළුමනින්ම කාටත් විවෘතව ඇති අතර, ප්‍රවාහන හා වෙළඳ කටයුතු ද අතීතයේ තිබුණාක් මෙන් සිදුවේ. පාසැල් හා විශ්ව විද්‍යාල ද හොඳින් ක්‍රියාත්මකව පවතී. උතුරු නැගණහිර ඡන්දය ද කිසිදු කලබලයකින් තොරව පැවැත්වුණි. කොටින්ගේ හෝ කොටි සහචරයන්ගේ ක්‍රියාකාරකම් කිසිවක්ද අසන්නට නොලැබේ. ප්‍රභාකරන්ගෙන් පසු නායකයා වන්නට සිටි කේ.පී. ද අත්අඩංගුවට ගැන්මෙන් පසු දැන් රජයේ කීකරු ශිෂ්‍යයෙකු බවට පත්ව සිටින බව ද ප්‍රවෘත්ති ජාලයෙන් අසන්නට ලැබේ. මේ ආදී කාරණා අනුව නම් සියල්ල යහපත් ය. බය වෙන්නටය කියා දෙයක් ලංකා ජනතාවට නැත.

එහෙත් ගිය සතියේ කොටියා අත්අඩංගුවට ගැන්මෙන් අප රටේ අය, විශේෂයෙන් සිංහළ ජනතාව සහ ශ්‍රීලංකා සන්නද්ධ හමුදා සිහියට ගතයුතු දෙයක් ස්ථිර වශයෙන් ම වෙයි. එනම් කොටියා තවම මැරී නැති බවයි. අපේ බහුතරය මෙලෝ සිහියක් නැතුව කන බොන, ප්‍රීතිවන, ජයඝෝෂා නගන වේලේ ලංකාවේ අදෘශ්‍යමානව සිටින කොටි පෝතකයින් වයසින්, දැනුමෙන් හා ක්‍රියාවෙන් වැඩී යළිත් ශ්‍රීලංකාව විනාශකිරීමට පියවර ගන්නට ඇසිපිය නොහෙලා බලාසිටින බව හොඳින් මතක තබාගත යුතුය. එසේම ලොවවටා සිටින කොටි හිතවාදී දෙමළ ඩයස්පෝරාව තව කොටි නැගී සිටීමකට අවශ්‍ය මුදල්, තාක්ෂණය, ක්‍රමවේද සියල්ල සම්පාදනය කිරීමේ යෙදී සිටින බව ද කල්පනාවට ගැන්ම යෙහෙකි. බොහෝ සිංහළයින්ට වසර තිහක් යුද්ධයක් තිබුණු බවක්වත් දැන් මතකනැත. එහෙත් කොටියාට ඊළම යනු සිහිනයක් නොවේ. එය වරක් අත ළඟටම ආ බව ඌ දනී. එසේ නම් දෙවන වර?

# නත්තලෙහි සැඟවුණු සැබෑ අරුත!



කාලකට පෙර ඒ බෙත්ලෙහෙමේ
ශුද්ධ වූ නගරේ.....
ජේසු මෙලොවට බිහිවුණේ
පුංචි ගව මඩුවේ.....


කිතු උපතේ මිහිර උදුවප් මස පුරාවට පැතිර යනවිට මෙම ගීතිකා පද පෙළ කිතුණුවන්ගේ මුවගට නැගෙනුයේ නිරායාසයෙනි. සාමයේ කුමරුන්, ජේසු බිළිඳුන්, දෙව් පුතුන් යන විවිධාකාර විරුදාවලියෙන් ජේසුස් ක්‍රිස්තුන් ස්වාමි දරුවාණන් අමතන අප උන්වහන්සේ මිනිසත් බව ගෙන මෙලොවට වැඩම කිරීමේ ප්‍රීතිය අප නත්තල් මංගල්‍යය තුළ සමරන්නෙමු.

මුළු මහත් කිතුණු ජනයා දෙසැම්බර් මස විසිපස්වන දින එනතුරු ඇහිලි ගණිනුයේ සුහද සිතින් එකිනෙකා සමගින් නත්තල් සුබ පැතුම් සහ ආසිරි බෙදා ගැනුමටය. කුඩා දරුවන් ජේසු බබාගේ කතාන්තරය සිය දෙමාපිය වැඩිහිටි කාගෙනුත් විමසනුයේ පුංචි සිත්පුරා උතුරා යන පුදුම සතුටකිනි. තවද මෙම උතුම් මංගල්‍යය සාමයේ සහ ප්‍රීතියේ මංගල්‍යය වනුයේ කිතුණු ජනයා තම මිනිස් දුබලකම් නිසාවෙන් සිත්හි නිදන් කරගත් අමනාපකම්, සිත් නොහොඳකම් ඉවත දමා තම සොයුරු සොයුරියන් හටත්, තම අසල් වැසියා හටත් මුළු සිතින් සමාව ලබාදී සුබ නත්තලක් වේවායි පැතීමෙනි.

කෙසේ වෙතත් වත්මන් සමාජයේ නත්තල සැමරීම මුදලටත්, තෑගි බෝග හුවමාරුවටත්, වෙළඳාම සහ කෑම බීමෙන් මන්මත් කරවන නොයෙකුත් සාදයන්ටත් පමණක් සීමා වී තිබීම කණගාටුවට කරුණකි. ඇතැම් කිතුණුවන් නත්තල් දින අපගේ උතුම්ම වන්දනාව වූ දිව්‍ය පූජා යාගයයටවත් සහභාගි නොවීම අද අපගේ කිතුණු බවට ද අභාග්‍යයක් වී ඇත.

අපගේ එකම වූ දෙව් පියානන්ගේ අසීමිත වූ ප්‍රේමය නිසාවෙන් ද, ශුද්ධාත්මයාණන් වහන්සේගේ ආනුභාවයෙන්ද, කන්‍යා මරිය තුමියගේ ශ්‍රී කුසයෙහි ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ පිළිසිඳීමත් සැබෑ දෙවියන් වූ උන් වහන්සේ සැබෑ මිනිසෙකුගේ ස්වරූපය ගෙන අප අතරට වැඩමකිරීමේ උතුම් දේව පණිවුඩය බොහෝ දෙනා හට අමතක වී ඇත. දිළිඳු ගවමඩුවක ඉපදුණු ජේසුතුමන්ගේ කීකරුබව, බැගෑපත්කම, අමිල ප්‍රේමය යන උතුම් වටිනාකම් ගැන නත්තල් සමය තුළ මඳකට හෝ මෙනෙහි කිරීමටත්, එම ගුණ ධර්මයන්ගෙන් කිතුණු අපගේ අධ්‍යාත්මයන් පොහොණි කරගැනුමටත් වෙර දරන්නෙමු නම් සැබෑ නත්තලෙහි අරුත එයම නොවන්නේද?

තාවකාලික සතුටකට යටවන සාදයන් සහ වෙළඳාම් වලට මඳ විරාමයක් ලබා දී අප අතර අසරණව සිටින කෙනෙකුට පිළිසරණක් වන්නට දෙනෙත් හැර බලන්නේ නම් ඒ අපගේ කිතුණු බව දෙව්පියාණන් වහන්සේට ප්‍රසන්න වන බවට නොරහසකි. නත්තලෙහි ප්‍රීතිය මුළු සිතින් එකිනෙකා හා සමරණ අතරම එදා කුඩා ගව මඩුවක ඉපදුණු සාමයේ කුමරුන් හට අප සිත් තුළද ඉපදෙන්නට ඉඩක් ලබාදීමට තවත් නත්තලක් අපගේ දොරකඩ හිනැහෙමින් බලාහිඳී.



ඔබ සැමට අසිරිමත් නත්තලකට සුබ පතමි!

♦ පියුමලී විජේගුණවර්ධන - කන්‍යා සොහොයුරිය
♦ Sister- Pumali Wijegunawardene - *London N4*

## ❊ නව සහශ්‍රයට ධර්මානුශාසනා ❊

### හිතොපදේශයෙන්

ප්‍රාණා යථාත්මනොෂ්ටා - භූතානමපි තෙ තථා
ආත්මෞපම්‍යෙන භූතෙෂු - දයාං කුර්වන්ති සාධවඃ

**අර්ථය** : *තමා තම ප්‍රාණයට යම්සේ ප්‍රියවේද, අනෙක් සත්වයෝද එසේම ප්‍රිය වෙති. එනිසා, සත්පුරුෂයෝ තමා උපමා කිරීමෙන් සියලු සත්වයන් කෙරෙහි අනුකම්පා කෙරෙති.*

කිසිම කෙනෙකුට හිංසා පීඩා නොකිරීම අවිහිංසාවයි. ඇනුම් බැණුම් අසන්නට, ගුටිබැට කන්නට කිසිවෙකු කැමති නැත. මේ බව අප හොඳින් වටහාගත යුතුය. සිතින් සියලු දිසා පිරික්සා බැලුවහොත් ඒ කිසිදු දිසාවක තමන්ට වඩා ප්‍රිය කෙනෙකු සොයාගත නොහැකි වනු ඇත. තම තමන්ගේ ජීවිත තමන්ට අතිශයින් ප්‍රිය ජනකය, මනාපය. එනිසා එය ආදර්ශමත්ව සලකා අනුන්ට හිංසා පීඩා නොකළ යුතුය. තමන් ගැන සිතා ඒ ආකාරයෙන් අන් සියළු මිනිසුන්ද සතුන්ද ඇතුළු සියළු ප්‍රාණීන් කෙරෙහි නිබඳ මෛත්‍රිය කරුණාව දැක්විය යුතුය. මේ ගුණධර්ම මිනිස් හදවත් තුළ වගාකරගත යුතුය. එවන් අය සැබෑ මිනිසුන් බව මේ පද්‍යයෙන් විස්තර කර ඇත. අනුන් වනසා තමන් සැනසෙන්නට සිතන අය නොමිනිසුන් බව මෙහි අවධාරණය කර තිබේ.

ඉවසීම උතුම්ම සීලයයි. ඉවසීමෙන් සැනසීම ළඟා කරගත හැකිය. කය, වචන සංවර කරගැනීම සමාජයේ බොහෝ අපරාධ අඩුකර ගැනීමේ මගයි. ලොව අද සෑම තැනම අඬදබර, කලකෝලාහල, මිනීමැරුම් සිදුවන්නේ කය වචන දෙක්හි අසංවරකම නිසාය. ඒ අසංවරකම යහපත හා අයහපත හඳුනාගැන්මට අපොහොසත්වේ. ඒ නිසාම සිත පෙළඹෙන්නේ නොමනා දෙයක් කිරීමටය. කය වචන දෙක සංවර කරගත් විට සැනසිලි දායක මිනිස් සමාජයක් තුළ හොඳින් ජීවත්වීමට පුලුවන.

සංවරකම මිනිසාගේ යහපැවැත්මටද දෙලෝ දියුණුවටද හේතු වේ. ශිෂ්ට සමාජයක් බිහිකිරීමට මහෝපාකාරී වේ. කාමයන්ට වහල් නොවී ඉඳුරන් දමනය කරගත යුතු ය. සිතට වහල් නොවී කටයුතු කිරීමට වග බලාගත යුතු ය. සංවරකම හෙවත් හික්මීම අවශ්‍යම දෙයකි. එසේම එම හික්මීම කෙනෙකු හරිමග ඔස්සේ දියුණුව කරා රැගෙනයයි. හික්මීම නැතිකල කෙනෙකු නිරායාසයෙන්ම යොමුවන්නේ පරිහාණිය දෙසටය.

කෙනෙකු තුළ ආත්ම පාරිශුද්ධිය ඇති කරගත හැක්කේ සත්ව හිංසාව වැනි පාපී ක්‍රියාවන්ගෙන් වෙන්වීම තුළිනි. පාපී සිතුවිලි පහලවීමෙන් සිත් කිළිටි වී සතුට අතුරුදහන් වේ. අසතුට හා අමනාපය සිතේ රජයයි. බොහෝ දෙනා වැඩ රාජකාරි කටයුතු වල නියැලුණද දවස ගෙවන්නේ සතුටින් නොවේ. උනුනුන් හා සිනාසී කතා කළද ජීවත්වන්නේ සැබෑ ප්‍රීතියෙන් නොවේ. ඒ සිනාව තුළ ද මානසික වේදනාව ගැබ්ව පවතී. ඊට හේතුව සිතේ සතුට නැතිකමයි. සතුට පහව යන්නේ තණ්හා, ආශා, ඊර්ෂ්‍යා, ක්‍රෝධ මානාදියෙන් පිරී පවතින නිසයි. මේවායින් සිත පිරී පවතින විට සතුට, සාමය, අනුකම්පාව වැනි ගුණධර්ම වලට සිතේ ඉඩක් නැත.

ප්‍රාණීන් අතර මිනිසා ශ්‍රේෂ්ඨ වුවද ඒ ශ්‍රේෂ්ඨත්වයට ඔහු පත්වන්නේ මිනිසෙකු තුළ පැවතිය යුතු ගුණධර්ම වලින් ඔහු පෝෂණය වුවහොත් පමණි. එසේ නොවන අය රූපයෙන් මිනිසුන් වුවද හැසිරීමෙන් තිරිසනුන් හා සමානය. මිනිසා තුළ නිරන්තරයෙන් තිබිය යුත්තේ කෙනෙකු විනාශ කරන ගතිය නොව කෙනෙකු ආරක්ෂා කරන දයාව අනුකම්පාව වැනි ගුණාංගයි.

♦ රාජකීය පණ්ඩිත - ශාස්ත්‍රපති
**පූජ්‍ය විල්ඔය විමලජෝති හිමි**



ලන්ඩන් බෞද්ධ විහාරය
London Buddhist Viharaya
The Avenue, London W4 1UD

## Recipe for Christmas All Year Long





Take a heap of child-like wonder
That opens up our eyes
To the unexpected gifts in life
Each day a sweet surprise.

Mix in fond appreciation
For the people whom we know;
Like festive Christmas candles,
Each one has a special glow.

Add some giggles and
some laughter,
A dash of Christmas food,
(Amazing how a piece of pie
Improves our attitude ! )

Stir it all with human kindness;
Wrap it up in love and peace,
Decorate with optimism, and
Our joy will never cease.

If we use this healthy recipe,
We know we will remember
To be in the Christmas spirit,
Even when it's not December.

♦ Joanna Fuchs


NORMA & Co
Associate Solicitors

2 Queens Parade
Green Lanes, London N8 0RD
Tel. 020 8348 7772 / 07717173414

Any type of Visa Applications
Car Accidents

*Colombo Office*
Visa Applications & Any Refusals
100/6 Rosemead Place
Colombo 7
Tel. 2672432 / 0777686632